චක්‍රලේඛ අංක : 05/2015

මගේ අංකය : බප/සසේකො/චක්‍රලේඛ-11 වෙළුම
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක : 109, මහ වීදිය,
බත්තරමුල්ල.
2015-09- 21

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු, සණස සමිති,
සමුපකාර මණ්ඩල සහ සමුපකාර සමිති/ සංගම් සභාපතිවරුන් වෙත,

**<u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා සහභාගීත්වය.</u>**

බස්නාහිර පළාතේ සමුපකාර සමිති සඳහා සේවකයින් බඳවා ගැනීම වෙනුවෙන් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණවල තේරීම් මණ්ඩලයේ සංයුතිය චක්‍රලේඛ අංක 07/99 මඟින් පෙන්වා දී ඇති අතර, එම විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරමි. එසේම, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2011 අනුව, සම්මුඛ පරීක්ෂණ සඳහා කොමිෂන් සභා නිරීක්ෂණ නිලධාරියෙකු සහභාගී කරනු ඇත. ඒ අනුව, සම්මුඛ පරීක්ෂණ තේරීම් මණ්ඩලයක් පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු වේ.

<u>තේරීම් මණ්ඩලය</u>

i. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති හෝ සභාපති වෙනුවෙන් වෙනත් අධ්‍යක්ෂවරයෙක් ( සභාපති විසින් නම් කරන)
ii. සමුපකාර සමිති පරීක්ෂක හෝ ඔහුට සහභාගී වීමට නොහැකි අවස්ථාවල දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් නම් කරනු ලබන වෙනත් දෙපාර්තමේන්තු නියෝජිතයෙක්
iii. රජයේ දෙපාර්තමේන්තුවක හෝ වෙනත් සමුපකාර සමිතියක විධායක මට්ටමේ නිලධාරියෙක්

<u>නිරීක්ෂණ නිලධාරීන්</u>

iv. කොමිෂන් සභාව විසින් නම් කරන නිලධාරී
v. සමිතියේ සාමාන්‍යාධිකාරී ( සාමාන්‍යාධිකාරී නොමැති සමිතිවල සභාපති විසින් නම් කරන නිලධාරියෙක්)

02. එසේ පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ට අමතරව බාහිර පුද්ගලයින් සහ අදාල නොවන සමිතියේ වෙනත් නිලධාරීන් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවට සහභාගී වන බව කොමිෂන් සභා නියෝජිත නිලධාරීන් විසින් නිරීක්ෂණය කොට මෙම කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත.

03. එසේ බාහිර පුද්ගලයින් සහභාගීවීමෙන් සම්මුඛ පරීක්ෂණයේ රහස්‍යභාවයට සහ විනිවිදභාවයට හානියක් සිදු වන බවත්, සම්මුඛ පරීක්ෂණය පිළිබඳ තොරතුරු පිටස්තර පුද්ගලයින්ට ලැබීමට ඉඩ ඇති බවත් මෙම කොමිෂන් සභාවේ අවධානයට ලක් විය.

04. එබැවින්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි සම්මුඛ පරීක්ෂණ තේරීම් මණ්ඩල සඳහා පත් කරනු ලබන සාමාජිකයින් පිළිබඳ විස්තර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බවටත්, එම අනුමත සාමාජිකයින් හැර බාහිර පුද්ගලයින් හෝ අදාල නොවන සමිති නිලධාරීන් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවට සහභාගී වූයේ නම් එම සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අවලංගු කිරීමට කටයුතු කළ යුතු බවටත් කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

05. ඒ අනුව, 2015-10-01 දින සිට ඉහත කොමිෂන් සභා තීරණය පරිදි ක්‍රියාමාර්ග ගැනීමටත්, මේ පිළිබඳව සමිතියේ සියළු නිලධාරීන් දැනුම්වත් කිරීමටත් කටයුතු කරන ලෙස කොමිෂන් සභා නියමය පරිදි දන්වා සිටිමි.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :
01. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත
02. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
03. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්
04. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර)
05. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
06. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්